# ජනමාධ්‍ය අමාත්‍යාංශය
# வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF MASS MEDIA

163, ඇසිදිසි මැදුර, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05.
163, அசிதிசி மெதுர, கிருளப்பனை மாவத்தை, பொல்ஹேன்கொட, கொழும்பு 05.
163, Asidisi Medura, Kirulapone Mawatha, Polhengoda, Colombo 05.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | MMI/AD02/02/01-02/2022 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023.07.14 |

**ජනමාධ්‍ය අමාත්‍යාංශයේ පවත්නා ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර**

උක්ත තනතුරු සඳහා පත් කර ගැනීමට ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව 01කි.

1. ප්‍රධාන අභ්‍යන්තර විගණක

ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයෙහි I ශ්‍රේණියේ නිලධාරී අයදුම්පත්කරුවන් නොමැති නම්, එකී තනතුරු වල පූර්ණකාලීන පදනමින් රාජකාරී කටයුතු ඉටු කිරීමේ පදනමින් අදාල සේවයේ වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති II ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් එකී තනතුර පිරවීම පිළිබඳව සලකා බලනු ලැබේ.

තනතුරේ රාජකාරී ඉටුකිරීමේ පත්වීම උපරිම ලෙස එක් වසරක කාලයක් සඳහා වන අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති අංක 121 අනුව ඉන් අනතුරුව සේවා දිගු සඳහා සලකා බලනු ඇත.

අයදුම්කරුවන් විසින් සිය ජීව දත්ත පත්‍රිකා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02/2022 හි දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍ර ආකෘතියට අනුව පිළියෙල කර දෙපාර්තමේන්තු ප්‍රධානී මඟින් ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි ලේකම් වෙත 2023 අගෝස්තු 04 දින හෝ එයට පෙර ලැබීමට සැලැස්විය යුතුය . admin@media.gov.lkවෙත පළමුව මෘදු පිටපත යොමු කර අනතුරුව දෘඩ පිටපත යොමු කරනු මැනවි.

ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ මෙන්ම අදාල ආකෘතියට අනුව සකසනු නොලැබූ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**2.0 අයදුම්කරු පැතිකඩ**

**2.1 පළපුරුද්ද සහ වෘත්තීය සුදුසුකම්;**

i. අදාල විෂය ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් පැවතීම.
ii. ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙහි දැක්වෙන පරිදි පශ්චාත් උපාධි සුදුසුකම (Postgraduate qualification) පැවතීම
iii. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව
iv. මාධ්‍ය ක්ෂේත්‍රයට අදාල ආයතනයක වසර 02ක් හෝ අවම වශයෙන් පළපුරුද්දක් ලබා තිබීම අතිරේක සුදුසුකමකි.

2.2 ශක්තීන්;

i. කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම
ii. සේවයට අවධානය යොමු කිරීම
iii. කාර්යක්ෂමතාව

2.3 චර්යාත්මක නිපුනතා

i. නායකත්වය
ii. සාර්ථක තීරණ ගැනීම
iii. ස්වයං සංවර්ධනය හා අනෙක් සේවක සංවර්ධනය

3.0 තෝරා ගැනීමේ ක්‍රමය

ජ්‍යෙෂ්ඨතාව මත පදනම් වූ ඇගැයීමකින් යුතුව අයදුම්පත සහ සම්මුඛ පරීක්ෂණය තුලින් ලබාගන්නා ලකුණු මත පදනව තෝරා ගැනීම් සිදු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණක් කැඳවනු ලැබේ.

3.1 ලකුණු දීමේ පටිපාටිය

| ශීර්ෂය | උපරිම ලකුණු | ඇගයුම් ක්‍රමවේදය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨත්වය<br><br>ජ්‍යෙෂ්ඨත්වයෙන් වැඩි ම අයදුම්කරුට උපරිම ලකුණු පිරිනැමෙන අතර අනෙකුත් අයදුම්පත් සඳහා ජ්‍යෙෂ්ඨත්වය සලකා ප්‍රමාණාත්මකව ලකුණු ලබා දෙනු ඇත. | 50 | අයදුම් පත්‍ර / සම්මුඛ පරීක්ෂණ |
| අදාල ක්ෂේත්‍රයෙහි පළපුරුද්ද<br><br>අදාල ක්ෂේත්‍රයෙහි/අදාල විෂය සම්බන්ධ දැනුමෙහි ප්‍රමාණයට අමතරව, අදාල ක්ෂේත්‍රයෙහි නියැලෙමින් හෝ එහි අත්දැකීම් ලබමින් අදාල ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඇති කර ගත් දැනුම හෝ නිපුනතාවයෙහි ප්‍රමාණය.<br><br>*(පුරප්පාඩුව පවත්නා තනතුරට අදාල ක්ෂේත්‍රයෙහි පළපුරුද්ද අත්‍යවශ්‍යයෙන් ම තිබිය යුතු නොවනු ඇත. කෙසේ වුවද, නිලධාරියෙහි ස්ථාන මාරු ලැබීමට පෙර ලැබූ පළපුරුද්ද සහිත ක්ෂේත්‍රයන් පිළිබඳ ලැයිස්තුවද සලකා බලනු ලැබේ. (උදා. ග්‍රාමීය සංවර්ධන, කුඩා කර්මාන්ත සංවර්ධන, සමාජ සේවා වැනි අංශයන්හි කටයුතු කළ නිලධාරියකු පලාත් ප්‍රාදේශීය පරිපාලනය වෙත ස්ථාන මාරු ලැබීම පිණිස පළපුරුද්ද ලැබ සිටිනවා විය හැකිය.)* | 20 | |
| වෘත්තීය සුදුසුකම්/ පර්යේෂණ සහ නව්‍යතා<br><br>1. ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් වන පශ්චාත් උපාධි සුදුසුකම්<br><br>අ. පර්යේෂණ-පදනම් වූ පශ්චාත් උපාධි පාඨමාලාව - | 10 | |

| | | |
|---|---|---|
| අ. පර්යේෂණ-පදනම් වූ පශ්චාත් උපාධි පාඨමාලාව - ළකුණු 7<br>ආ. ඉගෙනුම් පශ්චාත් උපාධි පාඨමාලාව - ළකුණු6<br>ඇ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව - ළකුණු 4<br>ඈ. උපාධි/ පශ්චාත් සහතික පත්‍ර පාඨමාලා - ළකුණු2<br><br>**2.** අදාල ක්ෂේත්‍රයෙහි ලද පුහුණුව/ පරිචය<br><br>අ. මාස 3ක් හෝ ඊට වැඩි කාලයක් - ළකුණු 1<br>ආ. දින 10ක් හෝ ඊට වැඩි කාලයක- ළකුණු 0.5<br>ඇ. දින 3ක් හෝ ඊට වැඩි කාලයක් - ළකුණු 0.2<br><br>**3.** ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතාව<br><br>අ.පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි ඩිප්ලෝමා සහතිකය/ IELTS ශාස්ත්‍රීය පුහුණු සමස්ථ ළකුණු 6.5 හෝ ඉන් ඉහල, TOEFL-CBT 213 හෝ ඉන් ඉහල, හෝ TOEFL-PBT හෝ ඉහල - ළකුණු 02<br><br>ආ. පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබා ගත් සහතිකය<br>- ළකුණු 01<br><br>ඉහලම සුදුසුකමට පමණක් ළකුණු එකතු කළ යුතුය. | | |
| ශක්තීන්<br>කාර්යයන් සඵලදායීව ඉටු කළ යුතු අතර අංක 2.2 හි දක්වා ඇති පරිදි අයදුම්කරු අභිප්‍රේරණය විය යුතුය. | 10 | සම්මුඛ පරීක්ෂණ |
| චර්යාත්මක නිපුනතා<br>කාර්යයන් හා ක්‍රියාකාරකම් අංක 2.3 හි දක්වා ඇති පරිදි සඵලදායීව සිදු විය යුතුය. | 10 | |

සටහන 1: 'පිළිගත් විශ්වවිද්‍යාලයක්' යනුවෙන් ඉහත අදහස් කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ විශ්වවිද්‍යාලයකි.

සටහන 2: උක්ත ලකුණු දීමේ පටිපාටියෙහි දක්වන ලද සියලු පශ්චාත් උපාධි සුදුසුකම් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ විශ්වවිද්‍යාලයකින් ලබා ගත් ඒවා විය යුතු අතර වෙනත් උපාධි පිරිනමන ආයතන වලින් ලබා ගත් එවැනි සුදුසුකම් කොමිෂන් සභාවෙහි පිළිගැනීම සහිත විය යුතුය.

- (උක්ත අයදුම්පත් කැඳවීම සම්බන්ධයෙන් වන මෙම දැන්වීමේ යම් අපැහැදිලිතාවයක් හෝ යම් පරස්පරතාවක් පවත්නා අවස්ථාවක් වේ නම් රාජ්‍ය සේවා කොමිෂන් සභා වක්‍ර ලේඛ 02/2022 හි ඇමුණුම අනුව සකස් කර ඇති ඉංග්‍රීසි මාධ්‍ය ආකෘතිය මුල්ලියවිල්ල ලෙස සැලකිය යුතුය.)



ලේකම්,
ජනමාධ්‍ය අමාත්‍යාංශය,
'ඇසිදිසි මැදුර'
අංක 163,
කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ,
කොළඹ 05.

## CURRICULUM VITAE *FORMAT*

1. Post applying for

2. Particulars about the applicant

   I. Name
   II. National Identity Card No.
   III. Age
   IV. Residential Address
   V. Contact Nos.
   VI. Email
   VII. Grade of the service
   VIII. Date of appointment to the service
   IX. Date of promotion to the present grade of the service
   X. Designation
   XI. Date of appointment to the present post
   XII. Ministry
   XIII. Department

3. Particulars about the service in the present grade

   I. No pay/half pay leave

| From | To | Total duration (Years/Months/Days) | Purpose |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

   II. Efficiency bars

| Efficiency bar | Due date of completion | Date of completion | No. and date of the letter granting concession/exemption, if any |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

   III. In case being subjected to a disciplinary action;

| Date and no. of the charge sheet | Disciplinary order (*If still pending, please indicate*) | Effective date of punishment/s, if any (i.e., date of commission of the offence) | Any period of service left out when calculating satisfactory service in terms of Public Service Commission Procedural Rule 186 (ii) |
|---|---|---|---|
| | | | |
| | | | |

4. Experience

4.1 Past service since date of appointment to the service

| Post | Ministry/Department /Institute | Duration | | Brief description of nature of responsibilities |
|---|---|---|---|---|
| | | From | To | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

4.2 Experience in the relevant subject (**Certified copies of letters of duty assignment must be attached.**)

| Post | Ministry/Department /Institute | Duration | | Brief description of nature of responsibilities |
|---|---|---|---|---|
| | | From | To | |
| | | | | |
| | | | | |

4.3. *Please describe briefly your proposals to enhance the effectiveness of management audit in government ministries and departments (Max. 150 words)*

5. Professional qualifications (***Certified copies of the certificates must be attached.***)
5.1 Postgraduate qualifications

| Postgraduate qualification | Subject | University/Institute | Effective date |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

5.2 Training

| Training | Institute/Organization | duration |
|---|---|---|
| | | |
| | | |
| | | |

5.3 Language competency

| Language | Qualification/Institute/Organization | Effective date |
|---|---|---|
| | | |
| | | |
| | | |

I do certify that the above particulars are true and accurate to the best of my knowledge.

………………………………

Signature of the applicant

**Certificate of the Head of Department***

*Option I* - I certify that the particulars furnished in section 3 of this curriculum vitae are correct as per the updated records in the personal file of the applicant, that, as at present, no disciplinary action has been contemplated against applicant* and, in case the applicant is selected for this post, he/she can/cannot be released from his/her present post /with replacement/without replacement.

*Option II* - I certify that the particulars furnished in section 3 of this curriculum vitae are correct as per the updated records in the personal file of the applicant and, in case the applicant is selected for this post, he/she can/cannot be released from his/her present post /with replacement/without replacement. I further state that, at present, a preliminary investigation concerning the applicant is in progress/about to be initiated and the nature of allegations against /suspected acts of misconduct of the applicant are as follows.

…………………………………………………………………………………………………………………………………

…………………………………………………………………………………………………………………………………

…………………………………………………………………………………………………………………………………

…………………………………………………………………………………………………………………………………

* *Strike off the inapplicable statement*

Signature of Head of Department